**<u>පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්බන්ධව විස්තර ගෙන්වා ගැනිම</u>**

**අංශය - හමුදා සම්බන්ධතා නිලධාරි කාර්යාලය**

| අනු අංකය | ලබා දෙන සේවාව/සේවාවන් | සේවාව ලබාදිමට ප්‍රථම සපුරාලිය යුතු අවශ්‍යතාවය | ඉදිරිපත් කල යුතු ලියවිලි/අයදුම්පත්‍ර/පෝරම | අයකරන මුදල ගාස්තුව | සේවාව ලබාදිමට ගතවන උපරිම කාලය (වැඩකරන දින ගණන) | සම්බන්ධ කළයුතු නිලධාරියාගේ නම/තනතුර (නිලය) හා දුරකථන අංකය |
|---|---|---|---|---|---|---|
| 1 | ආනයනය කරනු ලබන යාත්‍රා ඒන්ජින්, පිටත දහන යන්ත්‍ර සහ විනෝදාත්මක කටයුතු සඳහා වන කුඩා යාත්‍රා රේගු භාරයෙන් නිදහස් කිරීම සඳහා නිශ්කාෂණ ලබා දීම. | | 1. පහත සඳහන් විස්තර ඇතුලත් ඉල්ලීම් ලිපිය.<br>අ. ආනයනය කරනු ලබන විෂයේ මාදිලිය.<br>ආ. අනුක්‍රමික අංකය.<br>ඇ. එන්ජිමෙහි අශ්ව බල ප්‍රමාණය.<br>ඈ. ආනයනය කිරීමට අපේක්ෂිත විෂයන්හි ප්‍රමාණය.<br>ඉ. ආනයනය කිරීමට හේතුව.<br>2. ලදු පත (Invoice).<br>3. ඇසුරුම් ලැයිස්තුව (Packing List)<br>4. ඡායාරූප (හැකිනම්) | නැත | උපරිම දින 14 ක් පමණ. | |
| 2 | දේශීය මුහුදු සීමාවේ සහ වෙරළ තීරයන්හි සිදු කරන පර්යේෂණ සහ ගවේෂණ වැනි විවිධ ක්‍රියාකාරකම් සඳහා නිශ්කාෂණ නිකුත් කිරීම. | අදාල අනෙකුත් සියළු රාජ්‍ය ආයතන සහ දෙපාර්තමේන්තු වෙතින් මේ සඳහා අනුමැතිය ලබාගෙන තිබීම. | 1. සියළු විස්තර ඇතුලත් ඉල්ලීම් ලිපිය (පර්යේෂණය/ ගවේෂණය තුලින් ලබා ගන්නා දත්ත පිටත පාර්ශවයන් සමඟ හුවමාරු කර ගන්නේනම් ඒ පිළිබඳ විස්තර ඇතුලත් විය යුතුය)<br>2. පර්යේෂණය/ ගවේෂණය සඳහා සහභාගීවන පුද්ගලයින්ගේ නාම ලේඛණය (විදේශකයින් සිටීනම් විදේශ ගමන් බලපත්‍රයන්හි ඡායාස්ථික පිටපත් ඉදිරිපත් කළ යුතුය).<br>3. පර්යේෂණය/ ගවේෂණය සිදු කිරීමට අපේක්ෂිත ප්‍රදේශය ඇතුලත් සිතියම.<br>4. අනුමැතිය ලබාගත යුතු වගකිව යුතු අනෙකුත් සියළු රාජ්‍ය ආයතන සහ දෙපාර්තමේන්තු වෙතින් පර්යේෂණය/ ගවේෂණය සිදු කිරීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බවට ලබා ගත් ලිපිවල පිටපත්. | නැත | උපරිම දින 14 ක් පමණ | සහකාර හමුදා සම්බන්ධතා නිලධාරි (නාවික) 779465289 අභ්‍යන්තර දුරකථන 10564 |
| 3 | මෙරට නිෂ්පාදනය කරනු ලබන යාත්‍රා අපනයනය කිරීම සඳහා නිශ්කාෂණ නිකුත් කිරීම. | | 1. පහත සඳහන් විස්තර ඇතුලත් ඉල්ලීම් ලිපිය.<br>අ. යාත්‍රාවේ සියළු පිරිවිතරයන්.<br>ආ. අපනයනය කරනු ලබන ක්‍රමවේදය.<br>ඇ. යාත්‍රාවේ ගමන් ගනු ලබන පුද්ගලයින්ගේ විස්තර.<br>ඈ. ආරම්භක වරාය.<br>ඉ. ගමනාන්තය.<br>ඊ. පිටත් වන දිනය.<br>2. යාත්‍රාව මුහුදු මාර්ගයෙන් ගමන් ගන්නා අවස්ථාවේදි යාත්‍රාවේ ගමන් ගන්නා පුද්ගලයින්ගේ ජාතික හැඳුනුම්පත් හෝ විදේශ ගමන් බලපත්‍ර වල ඡායාස්ථික පිටපත්. | නැත | උපරිම දින 21 ක් පමණ | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | විනෝදාත්මක කටයුතු සඳහා යොදා ගනු ලබන යාත්‍රාවන්ට අවසර ලබා දීම. | අදාල අනෙකුත් සියළු රාජ්‍ය ආයතන සහ දෙපාර්තමේන්තු වෙතින් මේ සඳහා අනුමැතිය ලබාගෙන තිබීම. | 1. පහත සඳහන් විස්තර ඇතුලත් ඉල්ලීම් ලිපිය.<br>අ. යාත්‍රාවේ මාදිලිය.<br>ආ. යාත්‍රාවේ භාවිතා කරනු ලබන එන්ජිමේ අශ්ව බල ප්‍රමාණය.<br>ඇ. ගමන් කළ හැකි මගීන් සංඛ්‍යාව.<br>ඈ. යාත්‍රාව ගමන් කිරීමට අපේක්ෂිත මුහුදු ප්‍රදේශය.<br>2. රක්ෂණ සහතිකයේ පිටපත.<br>3. යාත්‍රා හසුරුවන්නාගේ විස්තර සහ ඊට අදාල බලපත්‍රයන්හි පිටපත්.<br>4. අනුමැතිය ලබාගත යුතු වගකිව යුතු අනෙකුත් සියළු රාජ්‍ය ආයතන සහ දෙපාර්තමේන්තු වෙතින් මේ සම්බන්ධයෙන් ලබා ගත් ලිපිවල පිටපත්. | නැත | උපරිම දින 14 ක් පමණ | සහකාර හමුදා සම්බන්ධතා නිලධාරී (නාවික) 779465289 අභ්‍යන්තර දුරකථන 10564 |
| 5 | ත්‍රාසජනක ක්‍රීඩාවන් (Sky Diving/ Parachute Jump/ Paragliding/ Para motoring) සිදුකිරීම සඳහා අවැසි අනුමැතිය/ ආරක්ෂක නිෂ්කාශන ලබා දීම. | 1. ත්‍රාසජනක ක්‍රීඩා කටයුතු සඳහා ආයතනය මෙන්ම භාවිතා කෙරෙන ගුවන් යානාද ලියාපදිංචි කර තිබිය යුතුය. | 1. ආයතනයෙහි ඉල්ලීම් ලිපිය සහ එහි ලියාපදිංචි තොරතුරු ඇතුලත් විස්තරය (Company Profile).<br><br>2. සහභාගිවන පිරිසගේ ජාතික හැදුනුම්පත්/ විදේශ ගමන් බලපත්‍රයන්හි පිටපත් (NIC/ Passport copy).<br><br>3. ක්‍රීඩාවන් සිදුකෙරෙන ස්ථානය/ භූමිය අයත්/ පාලනය කෙරෙන හිමිකරු/ ආයතනය වෙතින් නිකුත් කරන ලද එකඟතා ලිපිය. (No objections letter).<br><br>3. අදාල පොලිස් ස්ථානය/ කොට්ඨාශය වෙතින් නිකුත් කරන ලද පොලිස් වාර්ථාව (Police Certificate). | නැත | සම්පූර්ණ කාර්යය සඳහා වැඩකරන දින 15-22. | 1. සහකාර හමුදා සම්බන්ධතා නිළධාරී (ගුවන්) – (10553) |
| 6 | මෙරට පිහිටි ගුවන් නියමුවන් පුහුණු කිරීමේ ආයතනයන්හි පුහුණුව ලබන විදේශිය සිසුන් සඳහා එම ගුවන් නියමු පුහුණුව සඳහා අවැසි තාවකාලික පියාසර අනුමැතිය/ ආරක්ෂක නිෂ්කාශන ලබා දීම (temporary flying approval for foreign student only DUAL training flights with a NIB cleared Flight Instructor or examiner). | 1. ගුවන් නියමුවන් පුහුණු කිරීමේ කටයුතු සඳහා ආයතනය මෙන්ම භාවිතා කෙරෙන ගුවන් යානාද ලියාපදිංචි කර තිබිය යුතුය.<br><br>2. NIB නිෂ්කාශන සහිත පියාසර උපදේශකයකු හෝ පරීක්ෂකවරයෙකු යටතේ පුහුණු කටයුතු සිදුකළ යුතුය. | 1. සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි ලිපිය.<br><br>2. ආයතනයෙහි ඉල්ලීම් ලිපිය සහ එහි ලියාපදිංචි තොරතුරු ඇතුලත් විස්තරය (Company Profile).<br>3. සිසුවාගේ විදේශ ගමන් බලපත්‍රයෙහි පිටපත් (Passport copy).<br>4. සිසුවාගේ රටෙහි පොලිස් සේවාව වෙතින් නිකුත් කරන ලද පොලිස් වාර්ථාව (Police Certificate). | නැත | සම්පූර්ණ කාර්යය සඳහා වැඩකරන දින 15-22. | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | සර්වේයර් ජෙනරාල් විසින් නිකුත් කරනු ලබන භූ ලක්ෂණාත්මක සිතියම්, අංකිත දත්ත හා ගුවන් ඡායාරූප මහජනයා සහ ආයතන වෙත විකිණීම සඳහා අනුමැතිය ලබාදීම | පුද්ගලයා හෝ ආයතනය විසින් සියළුම විස්තර ඇතුලත්වන පරිදි සර්වේයර් ජනරාල් වෙතින් ලිඛිත ඉල්ලීමක් සිදුකල යුතුය | ආයතනයේ හෝ පුද්ගලික ප්‍රයෝජනයක් සඳහාද යන්න හා අවශ්‍යතාවය කුමණ ප්‍රදේශයන් ඇතුලත් වන සිතියමක්ද යන්න සම්බන්ධයෙන් පැහැදිලි විස්තරයක් ඇතුලත් වන පරිදි ලිඛිත ඉල්ලීමක් සිදුකල යුතුය.<br>ආරක්ෂක හා ආර්ථික මරමස්ථාන පිහිටා ඇති ස්ථාන ඇතුලත් වන සිතියම් ඉල්ලුම් කරන පුද්ගලයින් සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් මෙම අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලබා ගත යුතුය. | ඉල්ලුම් කරනු ලබන සේවාව අනුව සර්වේයර් ජනරාල් විසින් ලබා දෙනු ලබන මිළ ගණන් වේ | වැඩකරන දින 07 - 14 දක්වා විය හැකිය | මාණ්ඩලික නිලධාරි 1<br>076-5303502<br>හමුදා සම්බන්ධතා නිලධාරි කාර්යාලය |
| 8 | ආරක්ෂිත ප්‍රදේශයක්/රාජ්‍ය ආයතනයක්/පොදු ස්ථානයක් ආවරණය වන පරිදි කිසියම් හෝ හේතුවක් මත ඡායාරූප/රූගත කිරීම් සිදුකිරිම සඳහා අනුමැතිය ලබාදිම | ඡායාරූප/රූගත කිරීම් සිදුකරනු ලබන ස්ථානය යම් (රාජ්‍ය/පුද්ගලික) ආයතනයකට අයත් වන්නේනම් එම ආයතනය වෙතින් අනුමැතිය ලිඛිතව ලබාගත යුතුය. | 01. අදාල ඡායාරූප/රූගත කිරීම් සිදුකරනු ලබන ස්ථානය/දිනය/සහභාගිවන අයවළුන්ගේ ජාතික හැදුණුම්පත් අංකයන් , දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුලත්ව ලිපියක් මගින් අනුමැතිය ඉල්ලුම්කල යුතුය.<br>02. ඡායාරූප/රූගත කිරීම් සිදුකරනු ලබන ස්ථානය යම් (රාජ්‍ය/පුද්ගලික) ආයතනයකට අයත් වන්නේනම් එම ආයතනය වෙතින් අනුමැතිය ලබාගන්නා ලද ලිපියේ පිටපතක් ඉදිරිපත් කල යුතුය.<br>03. රූගත කිරිමක්නම් ඊට අදාල තිර පිටපත ඉදිරිපත් කල යුතුය. | නැත | වැඩකරන දින 07- 10 දක්වා | |